# 7 ශ්‍රේණිය - සිංහල

## 14 පාඩම - නිවේදන

01). හැදින්වීම කියවා නිවේදනයක් යනු කුමක් ද යන්න ලියන්න.

<u>**නිවේදනයක ඇති මූලික ලක්ෂණ**</u>

- භාෂාව නිවැරදි ව හැසිරවීම.
- අන්‍යයන්ගේ අවධානය යොමු වන ලෙස කතා කිරීම.
- උක්ත මාතෘකාවට අදාළ ව පමණක් කරුණු ගොනු කිරීම.
- නිරවුල් ව හා පැහැදිලි ව වචන උච්චාරණය කිරීම.
- කිසිවෙකුට සිත් තැවුළක් ඇති නොවන පරිදි සංයමයෙන් කතා කිරීම.
- අවස්ථාවට උචිත පරිදි ස්වරය වෙනස් කොට කතා කිරීම.
- ස්ථානයට උචිත පරිදි ස්වරය වෙනස් කොට කතා කිරීම හා හඬ පාලනය.
- ඒ ඒ අවස්ථාවට ආවේණික වචන භාවිතය

පහත සඳහන් අවස්ථා සඳහා නිවේදන සකසන්න.

i. නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක ප්‍රථම තරඟ ඉසව්ව ආරම්භය
ii. ආගමික වතාවත් කිරීමට පූජ්‍ය පක්ෂයට ආරාධනා කිරීමේ නිවේදනය
iii. කොවිඩ් තත්ත්වය මත අනුගමනය කළ යුතු සෞඛ්‍ය පුරුදු

02). 115 පිටුවේ ඇති නිවේදනය හා සම්බන්ධ දෙබස හොඳින් කියවන්න. එහි ඇති නිවේදනයක මූලික ලක්ෂණ මොනවා දැයි ලියන්න.

03). 116 පිටුවේ ඇති නිවේදනය කියවන්න.පෙර නිවේදනයේ නොමැති ලක්ෂණ මොනවා දැයි ලියන්න